# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2182/44 – 2020 ජූලි මස 03 වැනි සිකුරාදා – 2020.07.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, මී කනුව පොම්පාගාරයේ සිට අම්පිටිය සේවා ජලාශය දක්වා සම්ප්‍රේෂණ නල එලීම හා නල මාර්ග නඩත්තු කිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා
නිවාස පහසුකම් අමාත්‍ය,.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත, නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දීය.

5/4/KY/2


1A – G32429 – 28 (2020/07)



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 270, අම්පිටිය උඩගම දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අම්පිටිය ගමේ පිහිටි, ''මිල්ලගහහේන'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 4.81 ක් පමණ වන ඉඩම් කොටස් දෙක:

කැබලි අංක : 01
ඉඩමේ නම : මිල්ලගහහේන
ප්‍රමාණය : පර්චස් 01

**මායිම්** :

*උතුරට* : හිමිකම් කියන අය නොදන්නා ඉඩම් කොටස;
*නැගෙනහිරට* : පරවශතා අයිතිය අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 2 (පොදු මාර්ගය);
*දකුණට* : එස්. ගමගේ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස;
*බටහිරට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු ඉඩම.

කැබලි අංක : 02
ඉඩමේ නම : මිල්ලගහහේන
ප්‍රමාණය : පර්චස් 3.81

**මායිම්** :

*උතුරට* : වෛද්‍ය ජයරත්න හිමිකම් කියන ඉඩම;
*නැගෙනහිරට* : මහනුවර - අම්පිටිය ප්‍රධාන මාර්ගය (මා.සං.අ.);
*දකුණට* : චින්තක හිමිකම් කියන ඉඩම;
*බටහිරට* : එස්. ගමගේ හිමිකම් කියන ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* කැබලි අංක 01 සහ 02

1. එස්. ගමගේ මහත්මිය,
   අංක 1/349,
   නුවර පාර,
   අම්පිටිය.

07 – 482

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.